# කොළඹ දිස්ත්‍රික් වෘත්තීය ඡායාරූප ශාලා හිමියන්ගේ සංගමය

## කැඳවීමේ කමිටුවේ පළමු වාර්තාව.

## 21-06-2020

මෙදින රනිල් මහතා, නික්සන් මහතා, වර්ණක මහතා, නුවන් මහතා සහ මනෝරි මහත්මියගේ මෙහෙයවීම මත කොළඹ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 නියෝජනය වන පරිදි 35 දෙනෙකුගෙන් සමන්විත කැඳවුම් කමිටු සාමාජිකයන් මාදිවෙල සමනල උත්සව ශාලාවට රාත්‍රී 07.00 වන විට එකතු විය. මෙහිදී පළමු පැමිණි පිරිස ලියාපදිංචි වීමේ අත්සන් තබා මෙම රැස්වීම සඳහා වැය වන වියදම පියවීම සඳහා එක් අයෙකු රු.1500/- බැගින් තාවකාලික භාන්ඩාගාරික ලෙස කටයුතු කරන නුවන් මහතාට ලබා දුනිමු. පසුව රැස්වීම ආරම්භ කරමින් ටෂ්මා ස්ටුඩියෝ අධිපති රනිල් මහතා පැමිණ පිරිස පිළිගැනීමේ කථාව සිදු කරන ලදී. පසුව අපට සංගමයක් හෝ එකතුවීමක අවශ්‍යතාවයන් සැබැවින්ම ඇත්දැයි සභාවෙන් රනිල් මහතා විමසුවිට තිමති ස්ටුඩියෝ අධිපති කුමාර මහතා සභාව අමතා දිගු කථාවක් සිදු කළේය. එහි දී ඔහු විසින් පෙන්වා දෙන ලද්දේ අතීතයේ සිට සංගමයක අවශ්‍යතාවය වෙනුවෙන් නොයෙක් විදිහට එකතු වූ බවත් නමුත් එම සංගම පවත්වාගෙන යෑමට නොහැකි වූ බවත්ය. තවද, ඡායාරූප ශාලා හිමියන් යනු දේශයේ ජීවනාලියට මහත් පිටිවහලක් වන පුද්ගලයෙකු බැවින් ඔවුන්ගේ රැකියාව සුරක්ෂිත කිරීමට වැඩපිළිවෙලක් අවශ්‍ය බවය. වැඩිදුරටත් ඔහු පවසා සිටියේ, අතීතයේ සිට ඡායාරූප ක්ෂෙත්‍රයේ මිල ගණන් රාජ්‍ය යාන්ත්‍රණයට සම්බන්ධ ඡායාරූප සේවාව අප සතුව පවත්වාගෙන යෑම සහ ඡායාරූප ශාලා හිමියන්ට රාජ්‍ය යාන්ත්‍රණයේ නිසි තැන නොලැබී ඇති බවය. අද දින මෙම ස්ථානයට පැමිණ සිටින පිරිස පිළිබඳව ඉතාම සෑහීමකට පත්විය හැකි බවත් මෙම කටයුත්ත ආරම්භ කිරීමට කටයුතු කළ සියළුමදෙනාට ස්තූතිවන්ත වන බව ප්‍රකාශ කරමින් ඔහුගේ කථාව නිම කළේය.

පසුව නැගී සිටි නික්සන් ඇඹුල්දෙනිය මහතා විසින් පවසන ලද්දේ, අප 7 දෙනෙකු පළමුව ස්කයිප් තාක්ෂණය ඔස්සේ සාකච්ඡාවක් සිදු කොට ඉන් පසුව අද දින මෙවැනි රැස්වීමක් සූදානම් කිරීමට කටයුතු කරනු ලැබුයේ අපට ඡායාරූප ශාලා හිමියන්ගෙන් ලැබුණු යහපත් ප්‍රතිචාර නිසාවෙන් බවත් තවද තාක්ෂණය දියුණුවීමත් සමඟ අප ඡායාරූප කර්මාන්තයට දැඩි බලපෑමක් එල්ලවී ඇති බව නොරහසක් වන බවත් මෙම කර්මාන්තය රැකගැනීම සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ සියළුම ඡායාරූපශාලා හිමියන් එක් විය යුතු බව ඔහුගේ අදහස විය. මට සහ තව කෙනෙකුට මෙම දැවැන්ත කර්තව්‍යය කිරීමට නොහැකි බවත් අපි සියළුදෙනා එක්වීම තුළ අපට වෘත්තීය ජයග්‍රහණ ලබාගැනීමට හැකි බවත් ඔහුගේ අදහස විය.

පසුව හංවැල්ල ලංකා ස්ටුඩියෝ හි මනෝරි මහත්මිය විසින් අසා සිටිනු ලැබුවේ, මෙම ස්ථානයට පැමිණි පිරිසට හරියාකාර අවබෝධයක් මේ වනතුරු නිසියාකාරව ලැබී නොමැති බව ඇයගේ වැටහීම බවය. එහිදී නැගී සිටි ටෂ්මා ස්ටුඩියෝ හි රනිල් මහතා විසින් දීර්ඝ විස්තරයක් කරමින් පවසා සිටියේ, සමස්ථ ලංකා වෘත්තීය ඡායාරූප ශාලා හිමියන්ගේ කොළඹ දිස්ත්‍රික් සංගමය මීට

වසර 5කට පමණ පෙර බොරැල්ල වයි.එම්.බී.ඒ ශාලාවේදී ආරම්භ කරන ලද බවය. එදින එම සංගමය ඉතාම හදිස්සියේ නිසි සංවිධානයකින් තොරව ආරම්භ කරමින් නිලධාරී මණ්ඩලය ඉතාම හදිස්සියේ පත්කළ බවය. එම සංගමයේ සභාපති ලෙස මාව රංජිත් මහතා පත්කළ බවය. එම සංගමය නිලධාරීන්ගේ ක්‍රියාශීලීත්වය නොමැතිකම නිසා අක්‍රීය සංගමයක් ලෙස අකර්මන්‍ය තත්වයට පත්වූ බවද ටජ්මා ස්ටුඩියෝ රනිල් මහතා විසින් පවසනු ලැබුවේය. පසුව ලක්දම් ස්ටුඩියෝ අධිපති ලක්මාල් රොෂාන් සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් පැමිණ සිටි බහුතරය අසා සිටියේ නව ආරම්භයක් ලබාදීමට උත්සාහ කරනු ලබන්නේ සමස්ත ලංකා ශාඛාවට යන වගය. එහි දී රනිල් මහතා, නික්සන් මහතා, ඇතුළු 7 දෙනා පවසනු ලැබුවේ, කිසිසේත්ම එම සංගමය නැවත පණ ගැන්වීමට කිසිදු උත්සාහයක් නොගන්නා බවය. ඒ අනුව පෙර සංගමයේ කිසිදු වගකීමක් හෝ වගවීමක් නව සංගමය භාර නොගන්නා බව පිරිස තරයේ ඒකමතිකව පිළිගන්නා ලදී. අවසාන වශයෙන් පැමිණ සිටි පිරිස දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව පහත තීරණවලට එළඹුණෝය.

1. සංගමය ආරම්භ කිරීම සඳහා සුදුසු ස්ථානයක් සොයා බැලීම.
2. සංගමයේ ලෝගුව සහ නම අළුතින් යෙදීම.
3. කොට්ඨාශ 13ම නියෝජනය වන ආකාරයට සංගමය නිර්මාණය කිරීම.
4. කොරෝනා නීතිරීතිවලට එකඟව සීමිත පිරිසකගේ සහභාගීත්වයෙන් සහ කොට්ඨාශවල අනෙකුත් අය ඔන්ලයින් තාක්ෂණයෙන් සම්බන්ධ කරගෙන පළමු මහ සභාව සිදුකිරීම සුදුසු බවය.
5. නිළධාරී මණ්ඩලයට කොට්ඨාශ 13 නියෝජනය වන ආකාරයට පත්වීම් සිදුකල යුතු බවට ද එහිදී යෝජනා විය.
6. කොළඹ දිස්ත්‍රික් වෘත්තීය ඡායාරූප ශාලා හිමියන්ගේ සංගමය යන නාමය සුදුසු බවද යෝජනා විය.
7. සංගමය සඳහා ව්‍යවස්ථාව සැකසීම මෙම කැඳවීමේ කමිටුව සූදානම් කල කමිටුවට භාර කළෝය.

මෙම සාකච්ඡාව සඳහා පැය 4ක පමණ කාලයක් ගතවී තිබු අතර ඉදිරි වැඩකටයුතු දැඩි සහෝදර බැඳීමකින් යුතුව සිදුකිරීම අරමුණු කරගනිමින් රැස්වීමේ වැඩ කටයුතු නිමා කළෝය.